Good food, Good life

**මාධ්‍ය නිවේදනය**

**2021 අප්‍රේල් 7, කොළඹදී**

# පළමු වරට සංවිධානය කළ Nestlé-Hatch Idea Hackathon තරගයේ ජයග්‍රාහකයින් නිවේදනය කෙරෙයි

*නීරෝගිමත් සහ හරිතවත් ශ්‍රී ලංකාවක් උදෙසා දේශීය නිපැයුම් සහ අරමුණු කේන්ද්‍රකරගත් නවෝත්පාදකයින් සමග සහයෝගීතාවයෙන් කටයුතු කිරීමත් ඒ සඳහා සහාය දීමෙත් අරමුණු පෙර පෙරදැරිව*

පළමු වරට සංවිධානය කරන ලද Nestlé-Hatch Idea Hackathon විවෘත තරගයේ ජයග්‍රාහකයින් පසුගියදා නිවේදනය කෙරුණි. ඒ අනුව දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරමින්, නීරෝගිමත් ආහාර නිෂ්පාදන සඳහා නවමු අදහස් ඉදිරිපත් කළ හොඳම කණ්ඩායම සහ හොඳම හරිත ක්‍රියාවලියක් ඉදිරිපත්කළ කණ්ඩායම තරඟයේ ජයග්‍රාහකයින් ලෙස තෝරා පත්කර ගනු ලැබිණ. එහිදී නෙස්ලේ සමාගමේ ඇසුරුම්කරණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා නවතම තිරසාර ක්‍රමවේදයක් හඳුන්වාදීමට දුලංජ ගමනායක, අශාන් කෝට්ටගොඩ සහ සචින්ති වීරසිංහ යන කණ්ඩායම සමත්විය. මේ අතර සමීහා ජබීර්, කේෂලා ජයවික්‍රම සහ ෂනිත මිරිහාන යන කණ්ඩායම, සම්පූර්ණයෙන්ම දේශීය අමුද්‍රව්‍ය භාවිත කරමින්, දේශීය පෝෂණ අවශ්‍යතාවන්ට සරිලන ලෙස නිෂ්පාදනය කළ, එමෙන්ම ග්‍රාමීය ගොවි ජනතාවට වාසි අත්කරදෙන, නව නිෂ්පාදනයක් /නිෂ්පාදන සංකල්පයක් එළිදැක්වීමට සමත්විය.

"දෙසීයට වැඩි අයදුම්පත් ප්‍රමාණයක් අතුරින් අවසාන 12 දෙනෙකු අප විසින් පළමුව තෝරාගනු ලැබුවා. නමුත් ඔවුන් අතුරින් ජයග්‍රාහී අදහස තෝරාගැනීම අතිශය දුෂ්කර කටයුත්තක් වුණා. අවසාන වටයේ තරගකරුවන් විවිධ පසුබිම්වලට අයත්, මුළු දිවයිනේ විවිධ ප්‍රදේශ නියෝජනය කළ පිරිසක්. ඒ නිසාම ඔවුන්ට දේශීය සංස්කෘතික වපසරිය පිළිබඳව මනා අවබෝධයක් සහ වටිනා අදහස් රැසක් තිබුණා.

දෙදිනක් පුරා පැවති මෙම තරගය අතරතුරදී ඔවුන්ට උපදෙස් ලබාදීමටත්, හොඳ සංකල්පයක්, ප්‍රායෝගික නිෂ්පාදන ආකෘතියක් බවට පෙරළාගන්නේ කෙසේද යන්න පිළිබඳව කියාදීමටත් අපට හැකිවුණා. මේ සෑම ක්‍රියාදාමයකටම පසුව අපට දකින්නට ලැබුණු අවසාන ප්‍රතිඵලය පිළිබඳව අපි බෙහෙවින් සතුටු වෙනවා. සියලු තරගකරුවන්ගේ නවෝත්පාදන චින්තනය ගැනත්, උනන්දුව ගැනත් මම පෞද්ගලිකව විස්මයට පත්වුණා කිව්වොත් නිවැරදියි. ශ්‍රී ලංකාව තුළ සිත්ගන්නා සුළු හා විවෘත මනසකින් යුත් තරුණ නවෝත්පාදක පරම්පරාවක් සිටින බව ඉන් මනාව පැහැදිලි වෙනවා. නීරෝගීමත් සහ හරිතවත් ශ්‍රී ලංකාවක් උදෙසා ඔවුන් හා එක්ව නවෝත්පාදන සඳහා කටයුතු කිරීමට ලැබීම අපටත් විශාල ගෞරවයක් හා සතුටක්", යනුවෙන් නෙස්ලේ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ෆැබ්රිස් කැවලින් මහතා ප්‍රකාශ කළේය.

ප්‍රථම වරට පැවැත්වූ Nestlé-Hatch Idea Hackathon තරගයේදීම ජයග්‍රාහකයින් බවට පත්වීම පිළිබඳ තමන් මහත් උද්දාමයට පත්වන බව ජයග්‍රාහී කණ්ඩායම් දෙකෙහිම සාමාජිකයෝ පැවසූහ. "ජයග්‍රාහක කණ්ඩායම් දෙකක් සිටින බව ප්‍රකාශ කළ විට අපිට එය විශ්වාස කිරීමත් අපහසු වුණා. ශ්‍රී ලංකාව තුළ නවෝත්පාදන චින්තනය සහිත පිරිසක්, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ අනාගතය නියමාකාරයෙන් හැඩගැස්වීම සඳහා ධනාත්මක දායකත්වයක් ලබාදෙන අප වැනි තරුණ පිරිස්වලට ඒ සඳහා මනා අවකාශයක් පවතින බවත් මේ හරහා අපට පැහැදිලි වුණා . මෙම තරගය අපට සුවිශේෂී අත්දැකීමක් ලබාදුන් බව කිව යුතුමයි . එහිදී අගනා සහායක් වගේම අපට හොඳ දැනුමක් ලබාදුන් නෙස්ලේ සහ හැච් ආයතනවලට අපගේ ස්තූතිය හිමිවෙනවා. අපගේ උපදේශකවරු නොමැතිව අපට මෙම ජයග්‍රහණය ලබාගත නොහැකියි. ධනාත්මක වෙනසක් සඳහා ඉදිරියේදීත් නවෝත්පාදන සිදුකිරීමට අපට දැන් විශාල දිරියක් ලැබී තිබෙනවා", ඔවුහු විස්තර කළහ.

"නිර්මාණ සංකල්ප බිහිකිරීමත්, ගැටලු විසඳීමත් සම්බන්ධයෙන් අප ආයතනය සතු ක්‍රියාවලියත් සමඟ නෙස්ලේ ආයතනය හා එක්ව මෙම තරගය සංවිධානය කිරීම සැබවින්ම විශිෂ්ට අත්දැකීමක්. අරමුණු මත පිහිටා ක්‍රියාකරන, නවෝත්පාදන කරා යොමුවීමේ විවෘත මනසක් පවතින, එමෙන්ම විශිෂ්ට අදහස් ඇති, සාර්ථකත්වය පසුපස හඹායන ව්‍යවසායකයින් හා උද්‍යෝගී උපදේශක පිරිසත් නිසා ජයග්‍රාහී අදහස් දෙකක් තෝරාගැනීමට හැකිවුණා. මෙම නව අදහස් යුගලයම නෙස්ලේ සමාගම විසින් ක්‍රියාවට නංවා ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පසුබිම වෙනස් කරනු දැකීම මගේ අපේක්ෂාවයි," යනුවෙන් Hatch ආයතනයේ සම-නිර්මාතෘ ජීවන් ඥානම් මහතා ප්‍රකාශ කළේය.

තිරසාරත්වය හා පෝෂණය පිළිබඳ වටිනා අදහස් කඩිනමින් හඳුන්වාදීමේ වෑයමක් ලෙස, දේශීය නවෝත්පාදකයින් වෙනුවෙන් විවෘත තරගයක් (open innovation Hackathon Challenge) සංවිධානය කිරීමට Hatch ආයතනය සමඟ නෙස්ලේ සමාගම එක්ව කටයුතු කළේය. මෙම තරගය අතරතුරදී දේශීය නවෝත්පාදකයින්ට, විශේෂඥයින් සහ උපදේශකයින් සමඟ සම්බන්ධ වී තම අදහස් හා සංකල්ප වැඩිදියුණු කරගැනීමටත්, ඒවා ප්‍රායෝගික ආකෘති ලෙස එළිදැක්වීමටත් අවස්ථාව උදාවිය. ලොව විශාලතම ආහාරපාන නිෂ්පාදන සමාගම වශයෙන්, ශ්‍රී ලංකාව තුළ සැබෑ වෙනසක් ඇති කිරීම වෙනුවෙන් තම ධාරිතාව හා විශේෂඥතාව සමඟ මෙම බාහිර නවෝත්පාදකයින්ගේ දැනුමත් යෙදවීම නෙස්ලේ සමාගමේ අපේක්ෂාව වී තිබේ.